**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**සමාජ විද්‍යා කලාප තරග - 2024**

**7 ශ්‍රේණිය**

**කාලය - පැය 1 යි මිනිත්තු 15 යි.**

**ශිෂ්‍ය / ශිෂ්‍යාවගේ නම :-**

**පාසලේ නම :-**

**පාසල අයත් වන කාණ්ඩය යටින් ඉරක් අඳින්න.**

**200 දක්වා / 201 සිට 500 / 501 සිට 1000 / 1000 ට වැඩි**

**සැලකිය යුතුයි. ප්‍රශ්න සියල්ලට ම මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න අංක 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. උම්මග්ග ජාතකයේ හේන හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද ?
   i. සේන්
   ii. පිටබිම්
   iii. නවදැලි හේන
   iv. සෙහෙන්

02. ගෝපාල ගාම යනුවෙන් අතීතයේ දී හැඳින්වූයේ
   i. ගොවීන් විසූ ගම්
   ii. ධීවර කර්මාන්තයේ යෙදුණු අය විසූ ගම්
   iii. ගව පාලනයේ යෙදුණු අය විසූ ගම්
   iv. මැණික් කර්මාන්තයේ යෙදුණු අය විසූ ගම්

03. අනුරාධපුර රාජධානියේ අවසාන රජතුමා කවුරුන් ද ?
   i. පළමු වන විජයබාහු රජු
   ii. පළමු වන සේන රජු
   iii. පස් වන මිහිඳු රජු
   iv. මානවම් රජතුමා

04. පෘථිවි ගෝලය මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර මිලියන
   i. 512 කි
   ii. 510 කි
   iii. 500 කි
   iv. 520 කි

05. දියණිවරුන් සූප ශාස්ත්‍රයේ දක්ෂයන් කිරීම, දෙමාපියන්ගේ වගකීමක් බව සඳහන් වන මූලාශ්‍රය වන්නේ

i. සද්ධර්මාලංකාරය

ii. මහා වංශය

iii. සද්ධර්මරත්නාවලිය

iv. සහස්සවත්ථුපකරණය

06. ජාත්‍යන්තර දින රේඛාව ලකුණු කර ඇත්තේ කුමක් පදනම් කරගෙන ද ?

i. කර්කටක නිවර්තනය $23.5^0$

ii. සමකය $0^0$

iii. දේශාංශ $180^0$

iv. මකර නිවර්තනය $23.5^0$

07. විස්තෘත පවුලක් යන්න හැඳින්වීම සඳහා භාවිතා කරන තවත් නමක් හඳුන්වන්න.

i. න්‍යෂ්ටික පවුල

ii. ව්‍යාප්ත පවුල

iii. ඒකීය පවුල

iv. විසිරුණු පවුල

08. ඔබේ පියාගේ අක්කාගේ හෝ නංගීගේ පුත්‍රයා හැඳින්වීමට භාවිතා කරන ඥාතිත්ව පදය වන්නේ

i. මාමා

ii. ඥාති සහෝදරයා

iii. මස්සිනා

iv. බාප්පා

09. ඔබ කෝපයට පත් වූ අවස්ථාවක ශරීරය තුළින් ඇතිවන ප්‍රතික්‍රියාවකි

i. සුසුම් හෙළීම

ii. හැඬීම

iii. මුහුණ මලානික වීම

iv. මුහුණ රතු වීම

10. 2024 වර්ෂය සඳහා ඔලිම්පික් උළෙල පැවැත්වීමට නියමිත රට වන්නේ

i. ප්‍රංශය

ii. චීනය

iii. ඇමරිකා එක්සත් ජනපදය

iv. බ්‍රසීලය

( ලකුණු 2 x 10 = 20)

අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රකාශ නිවැරදි නම් හරි ලකුණ ද ( √ ) වැරදි නම් වැරදි ලකුණ ( X ) ද වරහන තුළ යොදන්න.

11. වෙළඳාමට සම්බන්ධ අය වෙනම කණ්ඩායමක් ලෙස සංවිධානය වී සිටි අතර එම සංවිධාන "පූග" නමින් හඳුන්වා ඇත. ( )
12. සමක විෂ්කම්භය, ධ්‍රැව විෂ්කම්භයට වඩා වැඩිය . ( )
13. සියලු ආගමික බැතිමතුන් එකට වන්දනාමාන කරන එකම පූජනීය ස්ථානය දළදා මාළිගාවයි. ( )
14. පළමු වන සේන රජුගේ කාලයේ පළමු වන රාජ රාජ නම් චෝල අධිරාජයා ලංකාව ආක්‍රමණය කළේය. ( )
15. සෑම රාජ්‍යයකට ම වෙරළ මායිමේ සිට නාවික සැතපුම් 15ක සීමාවක් උරුම වේ. ( )

( ලකුණු 2 x 5 = 10)


අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

16. පළමු වන පරාක්‍රමබාහු රජු හා දෙවන ගජබාහු රජු අතර ඇති වූ සමගි ගිවිසුම .......................................... නමින් හඳුන්වයි.
17. රාජ්‍ය සේවකයන්ට වයස අවුරුදු .................. දී කැමති නම් විශ්‍රාම යා හැකි ය.
18. අප හට තොරතුරු ලබාගැනීමට පවතින රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ දුරකථන අංකය .......................... වේ.
19. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ...................................... අර්ධ ගෝලයේ ය.
20. රුසියාව සමඟ මෑත කාලීනව යුද ගැටුම් ඇති කර ගත් රට .............................. යි.

( ලකුණු 2 x 5 = 10)

අංක 21 සිට 25 තෙක් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


.21.



i.මෙම රූපයෙන් දැක්වෙන පිරිස නියැලී සිටින කාර්යය කුමක් ද ? ................................................................

ii.එය හඳුන්වන නම කුමක් ද ? ..................................

22.



i. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද ?

..............................................................

ii.මෙය ඉදි කරන ලද රජතුමා කවුරුන් ද ?

...........................................................

23.



i. මෙම රූපයෙන් දැක්වෙන ආගමික ස්ථානය නම් කරන්න.

.........................................................

ii. එම ආගමට සම්බන්ධ ආගමික උත්සවයක් නම් කරන්න. .

.......................................................................

24.




i. රූප සටහනේ දැක්වෙන වනාන්තර වර්ගය නම් කරන්න. .........................................................

ii .එහි කෙරෙන මානුෂ ක්‍රියාකාරකමක් ලියා දක්වන්න.

.........................................................................

25.




i. රූප සටහනේ දෙසින් හමන සුළං වර්ගය නම් කරන්න. .

.........................................................................

ii. සුළං වර්ගය හමන කාල වකවානුව සඳහන් කරන්න. (මාසවලින්).

.........................................................................

(ලකුණු 4 x 5 = 20)

ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

26.

i. නිශ්ශංකමල්ල රජතුමා අයත් රාජ වංශය කුමක් ද ?

..............................................................................................................................

ii. මෙතුමා මුහුණ දුන් අභියෝග 03 ක් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

27.

i. රාජ්‍ය සේවකයෙකු විශ්‍රාම යාමට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට දැනුවත් කළ යුතු වන්නේ කොපමණ කාලයකට පෙර ද ?

..............................................................................................................................

ii. සේවක නීති නිසි පරිදි ක්‍රියාත්මක නොවීමෙන් ඇතිවිය හැකි අවාසි 03ක් ලියන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

28.

i. සමාජය තුළ පූර්වාචාර්යවරුන් ලෙස පිළිගනු ලබන්නේ කවරෙක් ද ?

......................................................................................................

ii. පුද්ගලයෙකුගේ පිරිහීමට බලපාන්නා වූ ප්‍රබල සාධක 03 ක් නම් කරන්න.

......................................................................................................

......................................................................................................

......................................................................................................

29.

i. ලෝකයේ රටවල සමාජ සංවර්ධනය මනිනු ලබන සමාජ සංවර්ධන දත්තයක් නම් කරන්න.

......................................................................................................

ii. ශ්‍රී ලංකාවේ වෛද්‍ය හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව පෙන්නුම් කරන මිනුම් දඬු 03 ක් නම් කරන්න.

......................................................................................................

......................................................................................................

......................................................................................................

30.

i. අනුරාධපුර යුගයේ සමාජ සුභසාධනය සඳහා කටයුතු කළ පාලකයෙකු නම් කරන්න.

......................................................................................................

ii. සමාජ සුභසාධනය සඳහා ඉටු කරන ලද සේවා 03 ක් සඳහන් කරන්න.

......................................................................................................

......................................................................................................

......................................................................................................

( ලකුණු 5 x 5 = 25)

ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති ස්ථාන සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.

31. පොලොන්නරුව


32. ගාල්ල

33. දෙවුන්දර තුඩුව

34. සීගිරිය

35. නල්ලූර් කෝවිල

( ලකුණු 3 x 5 = 15)


N


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න